# මාධ්‍ය නිදහස හා මානව අයිතිවාසිකම්

මෙරට විශ්‍රාමික විප්ලවවාදීන්ට, බොරු ප්‍රබුද්ධයන්ට, කසිකබල් මාක්ස්වාදීන්ට (ඇතැම්හු මේ වර්ග එකකට වඩා අයත් වෙති.) හා වෙනත් එවැන්නන්ට පහසු ආදායම් මාර්ගයක් වී ඇත්තේ මාධ්‍ය නිදහස හා මානව අයිතිවාසිකම් ය. ලංකාවේ මාධ්‍ය නිදහසක් නැතැයි මේ අය කරන ප්‍රකාශවලට ඊනියා ජාත්‍යන්තරයේ හොඳ ඉල්ලුමක් ඇත. ඉල්ලුම නිසා ම නොවුණ ද එවැනි ප්‍රකාශවලට හොඳ ගෙවීමක් ද කෙරෙයි. ගෙවීම මුදලින් ම කෙරෙන්නේ යැයි නො කියමි. විදේශ සංචාරයක් වුව ද ගෙවීමක් වෙයි. වෙනත් ආකාරයේ ගෙවීම් ද වෙයි.

පසුගිය දා එක්තරා ජාත්‍යන්තර සංවිධානයක් මගින් කෙරුණු ශ්‍රේණිගත කිරීමකට අනුව මාධ්‍ය නිදහස අතින් ගත්කල ලංකාව ඇත්තේ මාල දිවයිනට හා නේපාලයට ද පහළින් ය. ඒ අනුව ලංකාව ලෝකයේ මාධ්‍ය නිදහස අඩුම රටවල් අතරින් එකකි. සෘජුව ම වෘත්තියෙන් මාධ්‍යවේදියකු නොවුවත් මම අවුරුදු තිහකට ආසන්න කාලයක් මාධ්‍ය ඇසුරු කරමි; ඒ සමග ගැටෙමි. එහෙත් මා දන්නා තරමින් අද මෙරට මාධ්‍ය නිදහසක් නැතැයි කිව නො හැකි ය. රජයේ මාධ්‍යවල පක්ෂග්‍රාහී බවක් දැකිය හැකි බව සැබෑ ය. එහෙත් ඉන් කියැවෙන්නේ මාධ්‍ය නිදහසක් නැති බව නො වේ. පෞද්ගලික මාධ්‍යවල එයට ද වඩා පක්ෂග්‍රාහී බවක් ඇත. රජයේ මාධ්‍ය ආණ්ඩුවට පක්ෂපාත වන අතර පෞද්ගලික මාධ්‍ය විවිධ පක්ෂවලට පක්ෂපාතී වෙයි. අද ඇතැම් ඉරිදා පුවත්පත් ආණ්ඩුවට විරුද්ධවනවා පමණක් නො වේ. ඒ පුවත්පත්වල ද්වේෂ සහගත බවක් ද දැකිය හැකි ය. ඇතැම් කතුවරුන් ඇතුළු ලේඛකයන්ගේ ඇත්තේ ආණ්ඩුව කෙරෙහි වූ ද්වේෂයක් පමණක් බව ඔවුන්ගේ ලිපි ලේඛන කියවන විට පෙනී යයි.

එවැනි පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය පවත්වාගෙන ගිය ද ආණ්ඩුව කිසිවිටෙකත් ඒ මාධ්‍ය පාලනය කිරීමට උත්සාහයක් දරා නැත. එහෙත් ඉහත සඳහන් ප්‍රබුද්ධයන් හා අනෙක් අය කට ඇරියොත් කියන්නේ මෙරට මාධ්‍ය නිදහසක් නැති බව ය. මොවුහු තමන්ගේ ම වූ ලෝකයක් නිර්මාණය කර එය බටහිරයන් ට ඔබින අයුරින් අර්ථ දක්වමින් තම මතය සෙසු ලෝකයා ඉදිරියේ ප්‍රචලිත කරති. ඔවුන් සේවය කරන්නේ බටහිරයන්ට ය. කසිකබල් මාක්ස්වාදීන් ද අද බටහිරයන්ට සේවය කිරීම පුදුමයක් නො වේ. කතෝලික චින්තනයෙන් බිහි වී ඇති කතෝලික පල්ලියට මෙන් ම මාක්ස්වාදයට ද අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සේවය කිරීම හැර විකල්පයක් නැත. ඉහත සඳහන් පුද්ගලයන්ගේ කසිකබල් මතය මෙරට දී තුට්ටුවක්වත් නො වටියි. එහෙත් ඒ මතවලට ඊනියා ජාත්‍යන්තරයේ විශාල ඉල්ලුමක් ඇත. බටහිරයෝ එවැනි මත උපුටා දක්වමින් ලෝකයේ අඩුම තරමින් යම් පිරිසක් ඉදිරියේ මෙරට මාධ්‍ය නිදහසක් නැති බවට වෙනත් මතයක් නිර්මාණය කරති.

ඊනියා ප්‍රබුද්ධයන්ට හා අනෙක් අයට තැනක් ලැබෙන්නේ පිටරට මිස මෙරට නො වේ. මෙරට වැසියෝ ලංකාවෙහි මාධ්‍ය නිදහසක් ඇති බව දනිති. අඩුම තරමින් විශ්‍රාමික විප්ලවවාදීන්ට, බොරු ප්‍රබුද්ධයන්ට, කසිකබල් මාක්ස්වාදීන්ට මෙරට මාධ්‍ය නිදහසක් නැතැයි කීමේ නිදහසවත් ඇත. මෙරට ඇති මාධ්‍ය නිදහස ප්‍රයෝජනයට ගනිමින් ම මාධ්‍ය නිදහසක් නැතැයි කියන මේ බටහිර ගැත්තන්ගේ මත බටහිර දී කියවන පිටරට ජනතාව සිතන්නේ ලංකාවේ මාධ්‍ය නිදහසක් නැති බව ය.

මාධ්‍ය නිදහස ඇති රටවල් ශ්‍රේණි ගත කරන සංවිධාන කවරේ ද? මේ සංවිධානවලට අවශ්‍ය ඊනියා තොරතුරු ලබා දෙන්නේ කවු ද? මේ සංවිධානවලට එලෙස ශ්‍රේණි ගත කිරීමට අවසර ලබාදුන්නේ කවු ද? එසේ ශ්‍රේණි ගත කිරීමේ දී යොදාගන්නා නිර්ණායක කවරේ ද? කෙටියෙන් කීවහොත් මේ සංවිධාන පිළිබඳ පාරදෘශ්‍යභාවයක් ඇත් ද? මේ සංවිධාන ගැන අප දැන ගන්නේ ඔවුන්ගේ ශ්‍රේණි ගත කිරීමක් මෙරට පෞද්ගලික මාධ්‍ය ඔස්සේ ඒ සංවිධාන පිළිබඳ කිසිම තොරතුරක් නැතිව ප්‍රචාරය කරන විට ය. බටහිරයන් අපට තම අධ්‍යාපන ක්‍රමය හා ඊනියා අපක්ෂපාත ජනමාධ්‍ය ඔස්සේ පෙන්වාදීමට තැත්කරන්නේ මේ සංවිධාන අපක්ෂපාත බව ය. අපක්ෂපාත වන්නේ රහතන් වහන්සේලා පමණ ය. නිවන් අවබෝධ කර නැති සෑම අයෙක්ම පක්ෂපාති වෙති. මොවුන්ගේ මේ ඊනියා අපක්ෂපාත සංවිධාන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පක්ෂපාති වෙයි. ඒ සංවිධානවලට ද අවශ්‍ය වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය රැකීම ය. එහි දී ඒ සංවිධාන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අවශ්‍යතාවන්ට එරෙහිව යන රටවල් පිළිබඳ වැරදි මතයක් ඇතිකිරීමට කටයුතු කරයි.

© Prof. Nalin De Silva

කසිකබල් විශ්‍රාමික විප්ලවවාදීන්ගේ හා අනෙක් අයගේ මතවලට මෙරට වටිනාකමක් නැති වුව ද කලින් සඳහන් කළ ආකාරයට ඒවාට බටහිර ලෝකයෙහි වැදගත්කමක් හිමි වෙයි. බටහිර ලෝකයට ඒ මත වැදගත්වන්නේ ඇයි? අප රට සම්බන්ධයෙන් ගත්කල අද බටහිරයන්ට අවශ්‍යවන්නේ සිංහලත්වය නැතිකිරීම ය. ඒ කළ නොහැකි නම් සිංහලත්වය දුර්වල කිරීම ය. ඒ සඳහා ඔවුන්ට අද කොටි සංවිධානය අවශ්‍ය වේ. වෙනත් වචනවලින් කියන්නේ නම් බටහිරයන්ට අවශ්‍ය වනුයේ කොටි සංවිධානයේ පරාජය වැළැක්වීමට ය. බටහිරයන්ට හා ඊනියා ජාත්‍යන්තරයට අවශ්‍ය වනුයේ කොටි පරාජයෙන් බේරාගෙන, හැකිනම් ඔවුන් යොදාගෙන, සිංහලත්වය නැතිකිරීම ය. කොටි පරාජය වැළැක්වීමට නම් අද හමුදාව දියත්කර ඇති දෙමළ ජනතාව කොටින්ගෙන් ගලවාගැනීමේ මානුෂික මෙහෙයුම් කෙසේ හෝ නැවැත්වීමට බටහිරයන්ට සිදුවෙයි. ඒ මෙහෙයුම් නැවැත්වීමට ආණ්ඩුවට බලපෑම්කිරීම බටහිරයන්ගේ ප්‍රතිපත්තිය වෙයි. එහි දී බටහිරයෝ විවිධ උපක්‍රම අනුගමනය කරති. ලංකාවේ මාධ්‍ය නිදහස හා මානව අයිතිවාසිකම් නැත යන්න ප්‍රචාරය කර, ඒ තහවුරු කර, එනම් බටහිරයන්ගේ මිනුම් දණ්ඩෙන් ඒ තහවුරු කර, ඉන්පසු ආර්ථික තහංචි පැණවීම, එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට කටයුතු කිරීම බටහිරයන්ගේ ප්‍රධාන උපක්‍රමය වෙයි. බටහිරයන් අද රොක්ලාගේ සිට ආබර්ලා දක්වා විවිධ පුද්ගලයන් ලංකාවට එවන්නේ මෙරට ඊනියා මානව අයිතිවාසිකම් නැතිබව ලෝකයේ, එනම් ඔවුනොවුන් අතර හා ඔවුනොවුන්ගේ රටවල ඔවුනොවුන්ගේ මාධ්‍ය ඇසුරුකරන ජනතාව අතර, තහවුරු කර ගැනීමට ය. ඔවුන් ඊනියා මානව හිමිකම් කොමිසම් කාර්යාල ලංකාවේ පවත්වාගෙන යෑමට උත්සාහ කරන්නේ තමන්ට අවශ්‍ය තහවුරුව කර ගැනීමට ය.

මාධ්‍ය නිදහස, මානව අයිතිවාසිකම් ආදියට නිර්වචනවලින් (අර්ථ දැක්වීම්වලින්) ස්වායත්ත වූ අදහසක් නැත. මාධ්‍ය නිදහස, මානව අයිතිවාසිකම් ආදිය නිර්වචනය කරන්නේ කවු ද? සත්තකින් ම ඒ ලංකාවේ පුවත්පත් කතුවරුන්, රූපවාහිනී නාලිකාවල අධ්‍යක්ෂකවරුන්, ජනමාධ්‍ය මහාචාර්යවරුන්, සමාජ විද්‍යා මහාචාර්වරුන් නම් නොවන බව පැහැදිලි ය. ඔවුහු ද බටහිර නිකුත්වන පොතක් පතක් කියවා එසේත් නැත්නම් අන්තර්ජාලයෙන් දැනුම බාගෙන (ඩවුන් ලෝඩ් කර) ඒ නිර්වචන දැනගනිති. අද බටහිරයන් මානව අයිතිවාසිකම් යන බැරෑරුම් වචනයෙන් හඳුන්වන්නේ මානව අයිතිවාසිකම් නො වේ. මානව අයිතිවාසිකම් ගැන කතාකිරීමට පෙර මානවයා යනු කවරකු දැයි අපට කියා දෙන්නේ කවු ද? මානවයා යන සාධාරණ (ජෙනරල්) පදයෙන් හැඳින්වෙන වියුක්ත මානවයා කවු ද? ඒ මානවයා ඊනියා පශ්චාත්නූතනවාදීන්ට ද ඔවුන්ගේ දුර්වල සංකල්පවලින් ෆැන්ටසියක් නොවන්නේ ඊනියා පශ්චාත්නූතනවාදය ද අවසාන වශයෙන් ගත්කල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ම බිහිවූ කසිකබල් දැනුම් පද්ධතියක් නිසා නො වේ ද? මෙද කසිකබළුන්ට මානවයා තරම් සාධාරණ සංකල්පයක් නොවූ සිංහලයා යන්න ෆැන්ටසියකි. එහෙත් මානවයා ෆැන්ටසියක් නො වේ. මොවුන්ගේ ෆැන්ටසිය යන සංකල්පය ද ඊනියා ෆැන්ටසියකි. දරිද්‍ර න්‍යායක් වූ ඇරිස්ටෝටලීය න්‍යායට (ලොජික්) අනුව හෝ ඩෙරීඩාගේ මනස්ගාතවලට අනුව හෝ ඊනියා ද්විමය විරුද්ධයන් (බයිනරි ඔපසිෂන්) වූ සාධාරණත්වය හා විශේෂත්වය අතර ඇති වියුක්ත ගැටළුව නිරාකරණය කර ගැනීමට නොහැකි බටහිරයෝ ෆැන්ටසි වැනි කසිකබල් සංකල්ප ගොඩනගති.

බටහිරයන්ගේ මානවයා කොහේ සිටිය ද ඔවුන් මානව අයිතිවාසිකම් යනුවෙන් හඳුන්වන්නේ පුද්ගල අයිතිවාසිකම් ය. සාධාරණ මානවයාට අයිතිවාසිකම් තිබිය හැක්කේ කිනම් සංස්කෘතියකට සාපේක්ෂව ද? බටහිර රාජ්‍ය ඊනියා ජාතික රාජ්‍ය බවට පත්වීමේ දී ඒ රටවල තිබූ මානව අයිතිවාසිකම් කවරේ ද? රටක ස්වෛරීභාවය අභියෝගයට ලක්වන විට බටහිරයන් දුන් මානව අයිතිවාසිකම් මොනවා ද? ඊනියා දෙවැනි ලෝක යුද්ධ සමයේ දී බ්‍රිතාන්‍යයේ තිබූ මාධ්‍ය නිදහස හා ඔවුන් රැකි මානව අයිතිවාසිකම් කවරේ ද? අද බ්‍රිතාන්‍යයේ හා වෙනත් යුරෝපීය රටවල මුස්ලිම් කාන්තාවන්ට ඔවුන්ගේ ලෝගුව වැනි ඇඳුම ඇඳීමට අවසර නැත්තේ එලෙස සැරසුණු කාන්තාවක් කියන දේ පැහැදිලිව අසාගැනීමට වෙනත් අයකුට ඇති මානව අයිතිය කඩවේය යන බහුබූත තර්කය යොදාගනිමිනි. එවිට ඉතා පැහැදිලිව බ්‍රිතාන්‍යය ආරක්ෂා කරන්නේ මුස්ලිම් කානාතාවගේ මානව අයිතිවාසිය නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අයකුගේ, බොහෝ විට පිරිමියකුගේ, පුද්ගල අයිතියක් බව පැහැදිලි වනු ඇත. ඊනියා මානව අයිතිවාසිකම් යනු බටහිර ඒ ඒ සුදු පිරිමියාගේ පුද්ගල අයිතියක් බව පෙන්වාදිය හැකි ය. බටහිරයන් අප පාලනයකිරීම සඳහා අපට ලබාදෙන ඔවුන්ගේ සංකල්ප හා ප්‍රවාදවලින් අප මුළා විය යුතු නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva